www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සටන් විරාමය අවසන් වීමත් සමග ශ්‍රී ලංකාවේ ගැටුම තව තවත් උග්‍ර වෙයි

## Fighting in Sri Lanka continues unabated as ceasefire expires

**සරත් කුමාර විසිනි**
**2008 ජනවාරි 26**

ජනවාරි 16 වන දා 2002 දී ඇති කර ගත් ශ්‍රී ලංකාවේ සටන් විරාමය නිල වශයෙන් අවසන් වීම සංලක්ෂනය වී තිබෙන්නේ මිලිටරියත් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයත් අතර දෛනිකව හට ගන්නා ගැටුම්වලිනි. සටන් විරාමය ඒකපාර්ශ්වීයව ඉරා දැමීම මගින් ආන්ඩුවේ සහ මිලිටරියේ ඉහල නිලධරය ප්‍රකාශයට පත් කොට ඇත්තේ මේ වසර අවසානය වන විට උතුරුදිග වන්නි ප්‍රදේශය තුල ඉතිරිව පවතින එල්ටීටීඊ බල කඳවුරු අත්පත් කොට ගැනීම සඳහා තමන්ට තිබෙන අභිප්‍රාය යි.

ජනවාරි 11 වන දා යුද හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා විදේශීය වාර්තාකරුවන්ට කියා සිටියේ 2006 වසරේ මැද පටන් සිදු කල මෙහෙයුම් මගින් නැගෙනහිර දී සටන්කරුවන් 2,300ක් සහ උතුරේ දී සටන්කරුවන් 1,500කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මිලිටරිය මේ වන විට එල්ටීටීඊය සටන්කරුවන් 4,500කට පමන සීමා වූ තත්ත්වයකට පිරිහෙලා ඇති බව යි. ආන්ඩුවේ හමුදාවලට තදියමක් නැති බව පැවසූ මුත් ඔහු මේ වචන කීපය ද ඊට එක් කලේ ය: "මේ ගැටලුව ඊලඟ හමුදාපතිවරයාට භාර කරන්න මට වුවමනාවක් නැහැ." ෆොන්සේකා එලඹෙන දෙසැම්බරයේ දී විශ්‍රාම යාමට නියමිත ය.

ෆොන්සේකා විස්තර කරමින් සිටි දේ වනාහි කුරිරු යුද ගැටුමකි. මිලිටරියේ ඉලක්කය වන්නේ, එල්ටීටීඊයේ සැපයුම් මාර්ග කපා දැමීමට, ප්‍රතිරෝධය හීන කර දැමීමට, එල්ටීටීඊය දුර්වල කිරීමට, නොකඩවා ගුවනින් සිදු කරන බෝම්බ හෙලීම් මගින් සිවිල් වැසියන් අතර සන්ත්‍රාසය ඇති කිරීමට සහ එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශය තුලට නො නැවතී පෙරට යාමට තමන් සතු වඩා හොඳ අවි බලය සහ හමුදා බලය යොදා ගැනීම යි. මේ අතරවාරයේ හමුදාව, මිලිටරිය හා සන්ධානගත දෙමල පැරා මිලිටරි කන්ඩායම් සමග එක්ව එල්ටීටීඊයට යටින් වල කැපීම සහ රටේ දෙමල සුලුතරය ත්‍රස්ත කිරීම ඉලක්ක කොට ගත් පැහැර ගැනීම් සහ ඝාතනවලින් යුතු නීච යුද්ධයක් ද ගෙන යමින් සිටී.

ජනවාරි 2 වන දා වන විට සටන් විරාමයෙන් ඉවත් වීමට සිය ආන්ඩුවට ඇති අභිප්‍රාය පිලිබඳව දෙසතියක් කල් තබා නිවේදනයක් නිකුත් කරමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් 2002 සටන් විරාමය පිලිපදින බවට කල ව්‍යාජ මවා පෑම අත් හැර දමා ඇත. සැබවින් ම නම්, එල්ටීටීඊ පාලනය යටතේ පැවති මාවිල්ආරු ප්‍රදේශය අත්පත් කර ගැනීම සඳහා සිය පලමු ආක්‍රමනය දියත් කල 2006 ජූලි මස පටන් මිලිටරිය සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් සිට ඇත. සටන් විරාමය ජනවාරි 16 වන දා නිල වශයෙන් අවසන් වූ අතර, නොර්වේ රාජ්‍යයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) රටින් ඉවත්ව ගොස් තිබේ.

නැගෙනහිර පලාතේ පැවති සියලු ප්‍රධාන එල්ටීටීඊ කඳවුරු අල්ලා ගත් මිලිටරිය දැන් උතුරුදිග ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. එල්ටීටීඊයේ මූලස්ථානය පිහිටා තිබෙන්නේ කිලිනොච්චි නගරයෙහි ය. සටන ප්‍රධාන ප්‍රදේශ හතරක කේන්ද්‍රගතව තිබේ: එනම්, වයඹදිග පිහිටි මන්නාරම, යාපන අර්ධද්වීපයේ කිලිනොච්චියට උතුරින් පිහිටි මුහමලෙයි, කිලිනොච්චියට දකුනින් පිහිටි වව්නියාව සහ මුලතිව්හි පිහිටි ප්‍රධාන එල්ටීටීඊ කඳවුර ආසන්නයේ ඇති වැලිඔය නැගෙනහිර ප්‍රදේශ යි.

යුද්ධය පිලිබඳ ස්වාධීන වාර්තාකරනයක් නො පවතී. මිලිටරිය පුවත්පත් කලාවේදීන් යුද පෙරමුනු වෙත ලඟා වීම තහනම් කොට ඇති අතර, මොන යම් හෝ විවේචනාත්මක මාධ්‍ය ආවරනයක් සිදු වීම මැඩ පැවැත්වීමට සැලසුම් කල බිය ගැන්වීමේ වාතාවරනයක් නිර්මානය කොට තිබේ. එල්ටීටීඊය නිකුත් කරන වාර්තා මෙන් මිලිටරිය නිකුත් කරන වාර්තා ද තමන්ට වාසි වන අයුරින් සකසන ලද ඒවා වන අතර, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ජය ගන්නා බවට ආන්ඩුව කරන කියා පෑමට උඩගෙඩි දීම සඳහා ඒවා සැලසුම් කර ඇත. ජනවාරි මස මුල දී දිනමින පුවත්පතට කතා කරමින් ෆොන්සේකා ප්‍රකාශ කලේ, මිලිටරිය මුහුන දෙන " ලොකු ම ගැටලුව" වන්නේ "ජාත්‍යාලයෙන් තොර මාධ්‍ය" බව යි.

ජනවාරි 8 වන දා ටයිම් සඟරාවේ වාර්තාව මෙසේ පැහැදිලි කලේ යඃ "පවත්නා වාර්තාවලින් පැහැදිලි වන්නේ, එලඹෙන සතිවල දී හට ගනු ඇති නොවැලැක්විය හැකි ගැටුම් සඳහා ලකලෑස්ති වෙමින් ශ්‍රී ලංකාන්ඩුවේ හමුදා සහ දෙමල කොටි සටන්කරුවන් යන දෙකොට්ඨාසය ම රටේ උතුරුදිග ප්‍රදේශයෙහි පාලනය අල්ලා ගැනීම සඳහා අපේක්ෂාවෙන් පසුවන බව යි. ප්‍රදේශයේ වෙසෙන සිවිල් වැසියන් වාර්තා කලේ පසු ගිය සතිය පුරා බරපතල ෂෙල් වෙඩි සහ කාලතුවක්කු වෙඩි හුවමාරු වීම්වලට සවන් දිය හැකි වූ බව යි. 2008 වසරේ පලමු සති අන්තයේ ඇති වූ ැටුම්වලින් කොටි මිලිටරි රහස් ඔත්තු සේවයේ [නියෝජ්‍ය] ප්‍රධාන ෂන්මුගනාදන් රවිශංකර් ඇතුලු සටන්කරුවෝ 70කට වැඩි ගනනක් ඝාතනයට ලක් වූහ."

සටන් විරාමය අවසන් වීමෙන් පසුව බරපතල ම ගැටුම් හට ගෙන ඇත්තේ හමුදාව පසු ගිය ජූලි මස සිට ම එල්ටීටීඊයෙන් උදුරා ගැනීමට උත්සාහ දරමින් සිටින මන්නාරම් ප්‍රදේශයෙහි ය. අනෙකුත් උතුරුදිග ප්‍රදේශවල දී මෙන් ම මෙහි ද එල්ටීටීඊය සිය බල කඳවුරු ශක්තිමත් කොට ඇති අතර, දැඩි ඊසානදිග මෝසම් සුලං ධාරා නිසා මොන යම් ඉදිරියට යාමක වුව ද වේගය අඩාල වී තිබේ. පල්ලිකුලි, අඩම්පන්, උලියන්කුලම් සහ පරප්පන්කන්ඩල් ගම්මාන ආශ්‍රිතව සටන් පැවතී ඇත.

එල්ටීටීඊයට කෙරෙන සැපයුම් අවහිර කිරීම සඳහා තමන් දරන ප්‍රයත්නයන්හි කොටසක් ලෙස මිලිටරිය මන්නාරම විශේෂයෙන් ඉලක්ක කොට ගෙන තිබේ. පටු පෝක් සමුද්‍ර සන්ධිය හරහා මෙම ප්‍රදේශය දකුනු ඉන්දියානු තමිල් නාඩු ප්‍රාන්ත රාජ්‍යයට සමීපව පිහිටා ඇත. පසු ගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පුවත්පතේ සිය "තත්ත්ව වාර්තාවේ" දී ආරක්ෂක වාර්තාකාර ඉක්බාල් අතාස් කියා සිටියේ, මිලිටරිය මඩු ප්‍රදේශයට තල්ලු වීමේ එල්ලය වන්නේ විඩුදල්තිව්හි පිහිටි මුහුදු කොටි කඳවුරේ පාලනය අල්ලා ැනීම බව යි. දකුනු ඉන්දියාවෙන් අවිආයුධ ගෙන එන ප්‍රධාන හොර බඩු ජාවාරම් මාර්ගයක් යැයි මිලිටරිය කියා සිටි සිලාවතුරෙයි ධීවර ගම්මානය හමුදාව විසින් පසු ගිය වසරේ දී අල්ලා ත්නා ලදි.

"විඩුදල්තිව්හි පිහිටි මුහුදු කොටි කඳවුර අත්පත් කර ගැනීම මගින් ගරිල්ලන්ගේ තවත් ප්‍රධාන ගොඩ බැසීම් ප්‍රදේශයක් සහ මෙහෙයුම් කඳවුරක් අහෝසි වන බව මිලිටරි මූලාශ්‍ර පවසති. එමෙන් ම, සුලු ප්‍රමානවලින් මිලිටරි සහ වෛද්‍ය සැපයුම් හොරෙන් ගෙන ඒමට යොදා ත්නා තමිල් නාඩු වෙරල වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට ඇති අවස්ථාව ද එමගින් අහෝසි වන බව ඔවුහු කියති. සැපයුම් සංචිත ගබඩා කර තැබීම සඳහා ආරක්ෂිත නිවාස ස්ථාපනය කොට ගෙන ඇති ගරිල්ලන් ඒවා සුලු ප්‍රමානවලින් හොරෙන් ගෙන එන බව මූලාශ්‍රවලින් එලිදරව් වේ" යැයි සන්ඩේ ටයිම්ස් පුවත්පත ප්‍රකාශ කලේ ය.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් තමන්ගේ විශාල සැපයුම් නෞකාවලින් බොහොමයක් ගිල්වා දැමීම ද ඇතුලු සැලකිය යුතු සංවිධානාත්මක පසුබැසීම්වලින් එල්ටීටීඊය පසු ගිය වසර පුරා පීඩා විඳ තිබේ.

මිලිටරියේ වාර්තා මගින් පෙන්නුම් කෙරෙන්නේ සිදු වෙමින් පවත්නා සුලු පරිමාන ගැටුම් යඃ එනම්, " ත්‍රස්තවාදීන්ගේ බංකර" අල්ලා ගැනීම, සුලු අවි තිප්පොලවල් සොයා ගැනීම සහ කඩින් කඩ සිදු වන එල්ටීටීඊ ප්‍රතිප්‍රහාරයන් ය. පසු ගිය සතිය පුරා, එනම් ජනවාරි 17 වන දා යාපනයේ සහ වැලිඔය ඇති වූ වෙන් වෙන් සිදුවීම්වලින් "ත්‍රස්තවාදීන්" පස් දෙනෙකු ද, ජනවාරි 18 වන දා වව්නියාවේ සහ මඩකලපුවේ දී 19 දෙනෙකු ද, ජනවාරි 19 වන දා 2 දෙනෙකු ද, ජනවාරි 20 වන දා ප්‍රධාන වශයෙන් ම මන්නාරමේ ඇති වූ විවිධ ගැටුම්වලින් 32 දෙනෙකු ද, ජනවාරි 21 වන දා මන්නාරමේ සහ වව්නියාවේ දී 34 දෙනෙකු ද, ජනවාරි 22 වන දා මන්නාරමේ, වව්නියාවේ සහ වැලිඔය දී 31 දෙනෙකු ද, ජනවාරි 23 වන දා තවත් 3 දෙනෙකු ද ඝාතනයට ලක් වූ බව තත්ත්ව වාර්තාවල සඳහන් විය.

සිදු වූ හානි පිලිබඳ ආන්ඩුවේ සහ එල්ටීටීඊයේ වාර්තා අතර පුලුල් අසමානකම් පවතී. සන්ඩේ ටයිම්ස් පුවත්පතේ සිය තත්ත්ව වාර්තාවේ දී, මිලිටරිය සංඛ්‍යා ලේඛන මුසාකරනය කරන බව අතාස් නො කියා කී ය. "මෑත වසරවල දී රිල්ලන්ට එරෙහිව සිදු කල දීර්ඝතම ආක්‍රමනය වන මේ මිලිටරි කඩා වැදීමට අදාලව මන්නාරමෙන් ලැබෙන අනෙක් තොරතුරු බරපතල සීමා පැනවීම් නිසා ප්‍රසිද්ධියට පත් කල නොහැකි ය. තුවාලකරුවන්ගේ සංඛ්‍යා සහ භූමිය මත දී හටකායන් සිදු කල දිවි පිදීම් පිලිබඳ සංඛ්‍යා මේ අතරට අයත් වේ. පසුව කී කරුනට සම්බන්ධිතව ගත් කල, එවන් පියවරකින් හිමි කර දෙනු ඇත්තේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උදහසට ලක්වීමයි."

පසු ගිය මස අග දිනමින පුවත්පතට කල අදහස් දැක්වීම්වල දී යුද හමුදාපති ෆොන්සේකා පැහැදිලි කල පරිදි, මිලිටරිය දිනකට එල්ටීටීඊ සටන්කරුවන් 10 දෙනෙකු ඝාතනය කිරීමේ ඉලක්කයක් පිහිටුවා ගෙන තිබේ. දෛනික මල සිරුරු සංඛ්‍යාව ඉහල නැංවීම සඳහා ප්‍රාදේශීය අන දෙන නිලධාරීන් මිය ගිය සිවිල් වැසියන් පිලිබඳ සංඛ්‍යා ද ඇතුලත් කරන බවට සැකයක් නැත. මේ වාර්ගික යුද්ධයේ දී, මිලිටරිය සියලු දෙමල ජනයාට සලකන්නේ භව්‍ය "ත්‍රස්තවාදීන්" හැටියට ය. මේ සතියේ ආරක්ෂක අමාත්‍යාංශය කියා සිටියේ, මේ වසරේ ආන්ඩුවේ හමුදාවලට හටයන් 21 දෙනෙකු අහිමි වන අතරවාරයේ "ත්‍රස්තවාදීන්" 592 දෙනෙකු ඝාතනය කොට ඇති බව යි.

ඊයේ, මිලිටරිය කිලිනොච්චිය ආසන්නයේ සෙල්වනගර්හි පිහිටි එල්ටීටීඊ ප්‍රවාහන මධ්‍යස්ථානයක් යැයි කියන ලද ස්ථානයකට ගුවන් ප්‍රහාරයක් එල්ල කලේ ය. එල්ටීටීඊ හිතවාදී මූලාශ්‍රයකට අනුව, මේ ප්‍රහාරයේ දී අඩු ගනනේ එක් සිවිල් වැසියෙක් වත් ඝාතනයට ලක් විය. සිය මිලිටරිමය යටිතල ව්‍යුහය විනාශ කිරීම සහ සිවිල් ජනයා ත්‍රස්ත කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වැඩි වැඩියෙන් යොදා ගැනීමට සම්බන්ධිතව එල්ටීටීඊය සතුව කිසි ම සාධනීය පිලිතුරක් නැත. ඔවුන්ගේ "ගුවන් හමුදාවට" අඩංගු වන්නේ, කොලඹට බොහෝ දුරට සංකේතාත්මක වූ ප්‍රහාර එල්ල කිරීම සඳහාත් පසු ගිය ඔක්තෝබරයේ උතුරුදිග ගුවන් කඳවුරකට වඩා සෘජු ප්‍රහාරයක් එල්ල කිරීම සඳහාත් යොදා ගත් සැහැල්ලු ගුවන් යානා කීපයකි.

එල්ටීටීඊ වාර්තාවකට අනුව, සිසුන් 790 දෙනෙකුගෙන් සහ ගුරුවරුන් 22 දෙනෙකුගෙන් සමන්විත කනකපුරම් මහා විද්‍යාලයට මීටර 100ක් නුදුරින් පිහිටි ස්ථානයකට ගුවන් හමුදාවේ ජෙට් යානා ජනවාරි 17 වන දා බෝම්බ හෙලී ය. ප්‍රදේශයේ සිසුහු 5,000කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රදේශයේ පාසල්වලින් ඉවත්ව ගොස් ඇත. එම ගුවන් ප්‍රහාරයේ දී, එක් සිවිල් වැසියෙකු ඝාතනයට ලක් වී හත් දෙනෙකු තුවාල ලද අතර, නිවාස හයක් විනාශ විය. ආරක්ෂක අමාත්‍යාංශය මේ වාර්තාව ප්‍රතික්ෂේප කලේ නැත.

උතුරුදිග ප්‍රදේශයේ දී එල්ල වන මිලිටරිමය පීඩනය ලිහිල් කර ගැනීම සඳහා දරන ප්‍රයත්නයක් ලෙස එල්ටීටීඊය කොලඹ අගනුවර ඇතුලු දවයිනේ දකුනු ප්‍රදේශයේ ඉලක්කවලට ප්‍රහාර එල්ල කිරීමට උත්සාහ කරන බවක් පෙනී යයි.

27 දෙනෙකු මරනයට පත් කරමින් සහ 60 දෙනෙකුට ආසන්න ගනනකට තුවාල සිදු කරමින් පසුගිය සතියේ නැගෙනහිරදිග පිහිටි මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ආසන්නයේ දී බස් රථයකට එල්ල කල බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් ආන්ඩුව එල්ටීටීඊයට චෝදනා කර ඇත. එල්ටීටීඊය අතීතයේ දී සාමාන්‍ය සිංහල ජනයාට වග විභාගයකින් තොරව ප්‍රහාර එල්ල කොට ඇති නමුත්, වාර්ගික වෛරය උසි ගන්වා ලීම සඳහා සෘජුව හෝ තමන් හා සන්ධානගතව සිටින පැරා මිලිටරි කන්ඩායම් මගින් වක්‍රව හෝ එබඳු දාමරික ක්‍රියාවන් සංවිධානය කිරීමේ හැකියාව මිලිටරියට ද තිබේ.

යුද්ධයේ ආර්ථික බලපෑමට එරෙහිව පුලුල්ව පැතිරෙන විරුද්ධත්වයට මුහුන දෙමින් සිටින රාජපක්ෂ ආන්ඩුව, තමන් යලි ඇරඹූ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යුක්ති සහගත කිරීම සඳහා සැනෙකින් බෝම්බ ප්‍රහාරය සා කැවේ ය. ඉරිදා රාජපක්ෂ ප්‍රදේශයෙහි සංචාරයක යෙදුනු අතර, ගම්මුන් කීප දෙනෙකුගේ අවමඟුල් උත්සවවලට සහභාගි විය. ආන්ඩුව ප්‍රදේශයේ ගම්මුන්ට පතරොම් තුවක්කු බෙදා දී ඇති අතර, මොනරාගල දිස්ත්‍රික්කය සෝදිසි කිරීම සඳහා සොල්දාදුවන් සහ පොලිස් භටයන් දහස් ගනනක් බලමුලු ගන්වා තිබේ.

යුද්ධය යලි ආරම්භ කිරීමේ දී, ආන්ඩුව බලගතු ලෙස ජාත්‍යන්තර සහාය මත පදනම් විය. 2002 සටන් විරාමයට පසුව එලඹුනු "සාම ක්‍රියා දාමයේ" ඊනියා සමඅනුග්‍රාහකයන්, එනම් ජපානය, යුරෝපා සංගමය සහ නෝර්වේ රාජ්‍යය, යලි ඇරඹූ යුද්ධයට නිහඬව සහාය දී ඇත. පසු ගිය සතියේ කොලඹ සංචාරයක යෙදුනු ජපානයේ විශේෂ නියෝජිත යසුෂි අකාෂි ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් සිය "බරපතල කනස්සල්ල" පල කල මුත්, ආන්ඩුවට යලි සාම සාකච්ඡාවලට පිවිසීමට බල කිරීමක් වශයෙන් ආධාර ඉවත් කර ගන්නා බවට ටෝකියෝව කලින් කල තර්ජන නැවත යොදා ගනු ඇති බවට ඉඟියක් වත් නොකලේ ය.

ඉන්දියාව සහ එක්සත් ජනපදය යන දෙක ම නිහඬව රාජපක්ෂ ආන්ඩුවට මිලිටරි සහාය මෙන්ම දේශපාලන සහාය ද සපයයි. ඉන්දියාවේ විදේශ කටයුතු ඇමති ප්‍රනාබ් මුකර්ජි ජනවාරි 12 වන දා පුවත්පත් කලාවේදීන්ට මෙසේ කියා සිටියේ යː "... ශ්‍රී ලංකා හමුදා සහ එල්ටීටීඊය අතර ගැටුම් උග්‍ර අතට හැරිල තියෙනව. ත්‍රස්තවාදය ගැන උත්සුක වෙන තරමට අපේ ආස්ථානය වෙන්නෙ අප එය කිසිසේත් නොඉවසන බවයි. ඒ නිසා ත්‍රස්තවාදීන්ට එරෙහිව පියවර ගන්නා ඕනෑ ම රටකට තමන්ගේ නෛතික පද්ධතිය තුල හිඳිමින් එසේ කරන්න නිදහස තියෙනව."

ඉන්දියානු ගුවන් හමුදාව එල්ටීටීඊයට එරෙහිව තමන්ගේ ශ්‍රී ලාංකික සගයාට උදව් දී ඇති බව ඉන්දියානු නාවික හමුදාපති සුරීෂ් මේතා පිලිගත්තේ යැයි ඉන්දියාවේ එන්ඩීටීවී රූපවාහිනී සේවය ජනවාරි 16 වන දා වාර්තා කලේ ය. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජ්‍ය අන දෙන නිලධාරි වසන්ත කරන්නාගොඩ එල්ටීටීඊයේ කොඳු නාරටිය කඩා දැමීම සඳහා උදව් වීමේ දී පිදූ සංවිධානාත්මක සහාය සම්බන්ධයෙන් නව දිල්ලියට තුති පිදී ය.

තවත් සැලකිය යුතු වර්ධනයක් තුල, එක්සත් ජනපද ශාන්තිකර බලඇනියේ ප්‍රධාන අන දෙන නිලධාරි රොබට් විලාඩ් ජනවාරි 17 වන දා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි. එක්සත් ජනපද තානාපති කාර්යාලය නිකුත් කල පුවත්පත් නිවේදනයක සඳහන් වූයේ, අන දෙන නිලධාරියා නාවික පුහුනුව සහ රටවල් දෙක අතර හුවමාරුවන් ඇතුලු වෙරලබඩ ප්‍රදේශවල දැන් සිදු වෙමින් පවතින සහයෝගිතාව විමසුමට ලක් කල බව යි. රාජපක්ෂ සහ රටේ මිලිටරි නිලධරය හමු වූ ඔහු, "එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහි එක්සත් ජනපද-ශ්‍රී ලංකා සහයෝගිතාව" පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා නැගෙනහිරදිග ත්‍රිකුනාමලයේ පිහිටි නාවික හමුදා කඳවුරට සංචාරය කලේ ය.

ඉන්දියානු "සංවිධානාත්මක සහායේ" සහ එක්සත් ජනපද "සහයෝගිතාවේ" සැබෑ ස්වභාවය කුමක් ද යන්න සවිස්තරාත්මකව පැහැදිලි කොට නැත. එහෙත්, දියුනු උපකරනවල සහායෙන් සහ නවීන රහස් ඔත්තු සේවාවකින් තොරව පසු ගිය වසරේ දී දිවයිනේ සිට සැතපුම් දහස් ගනනක් එපිට මුහුදේ තිබූ එල්ටීටීඊ සැපයුම් බෝට්ටු නිවැරදිව ස්ථානගත කොට ගෙන ගිල්වා දැමීම ශ්‍රී ලංකාව සතු සීමිත නාවික සම්පත්වලට කල හැක්කක් නොවේ.

ගැටුමේ මිලිටරිමය ප්‍රතිඵලය මෙතෙකුදු අවිනිශ්චිත නමුත්, සර්පිලාකාරව ඉහල නැගෙන තෙල් මිල සහ වැඩෙන ජාත්‍යන්තර මූල්‍ය අස්ථාවරත්වය නිසා පැන නගින උද්ධමනය සමග මුසු වී මිලිටරි වැය දැවැන්ත ලෙස ඉහල යන තතු යටතේ, යුද්ධය විසින් බිඳෙනසුලු පාලක සන්ධානය මුහුන දෙන දේශපාලන අර්බුදය තීව්‍ර කරනු ලබමින් තිබේ. දෙසැම්බරයේ දී, වාර්ෂික පදනමකින් ගත් කල, රටේ උද්ධමන අනුපාතිකය දැවැන්ත ප්‍රතිශත අගයක් වූ සියයට 22කින් පිම්මේ ඉහල නැග්ගේ ය. ආන්ඩුව පිලිවෙතක් ලෙස වර්ජන සහ විරෝධතා රාජ ද්‍රෝහී වීමකට සමාන යැයි හෙලා දකින්නේ වුව ද, ආන්ඩුවේ ක්‍රියාවන් මගින් සමාජ අරගල වඩා බලගතු ලෙස පුපුරා යාමකට පසුබිම සකස් වෙමින් තිබේ.

© www.wsws.org